**ඩෙල්ෆ් ප්‍රාදේශීය සභාව**
**යාපනය දිස්ත්‍රික්කය**
**-------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන
**----------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
**-------------------------------**

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 26 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 29 දින හා විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 අගෝස්තු 31 දින සභාපති වෙත ඉදිරිපත් කරන ලදී.

### 1.2 තත්ත්වාගණනය කළ මතය
**------------------------------**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට ඩෙල්ෆ් ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
**--------------------------------------------**

**(අ) මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ ගිණුම්කරණ ප්‍රතිපත්ති**
**-----------------------------------------------------------**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ----------------------- | ----------------- | ------------------------ |
| ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | ඉදිරියේදී මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වේ. |

**(ආ) ගිණුම්කරණ අඩුපාඩු**
**----------------------**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ----------------------- | --------------------- | --------------- |
| (i) | සභාව භාවිතා කරනු ලබන වාහන 05 ක වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි. | අදාල වාහන 05 සඳහා අයිතිය පැවරීම සිදු කිරීමෙන් පසුව අවසන් ගිණුම්වල ඇතුළත් කරනු ලැබේ. | අදාල වාහන වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කළ යුතු වේ. |
| (ii) | ප්‍රාදේශීය සභාවේ මධ්‍යම පුස්තකාලයේ ඇති පොත්වලින් පොත් 46ක්ද, බටහිර පුස්තකාලයේ ඇති පොත්වලින් පොත් 02කුත් භාවිතයට නුසුදුසු හා කල් ඉකුත් වූ සහ විශාල වශයෙන් හානියට පත්වූ තත්ත්වයේ පැවැතුණි. මේ නිසා මූල්‍ය ප්‍රකාශනවල තොග වටිනාකම වැඩියෙන් දක්වා තිබුණි. | විනාශ කිරීමට කටයුතු කරනු ලැබේ. | භාවිතයේ නොමැති පොත්වල වටිනාකම තොග වටිනාකමින් ඉවත් කළ යුතුවේ. |

## 1.3.1 නොසැසඳු ගිණුම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය වර්ෂයේ ආදායම් හා වියදම් ගිණුමේ සැපයු භාණ්ඩ හා අවශ්‍ය භාණ්ඩ සඳහා රු.2,659,978ක් දක්වා තිබූ නමුත් වාර්ෂික වියදම් සාරාංශ වාර්තාවේ රු. 4,859,978ක් දක්වා තිබූ නිසා රු.2,200,000ක වෙනස්කම් නිරීක්ෂණය විය. | ජ'නල් සටහන් මාර්ගයෙන් ගැලපීම් කිරිම හේතුවෙන් වෙනස්වීම් සිදුවිය. | ගිණුම් සැසඳිය හැකි ආකාරයෙන් ගනුදෙනු සටහන් කිරිම සිදුකළ යුතුවේ. |

## 1.4 අනුකූල නොවීම

### 1.4.1 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) උප වගන්තිය | සභාව විසින් වාර්ෂික කාර්යසාධන වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි. | 2019 වර්ෂයේ වාර්ෂික කාර්යසාධන වාර්තාව මේ සමග අමුණා ඇත. | අදාළ පනතේ විධිවිධානවලට අනුව කටයුතු කළ යුතු වේ. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | මුදල් රෙගුලාසි 571 | වර්ෂ 02 ක් ඉක්ම වූ කල් ඉකුත් වූ කොන්ත්‍රාත් ඇප මුදල් තැන්පතු සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | වර්ෂ 02ක් කල් ඉකුත් වූ තැන්පතු අදාල අයට ආපසු ගෙවා ඇත. | නියමිත මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ඇ) | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ චක්‍රලේඛය | | | |
| | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛය | සභාවේ වාහන 08 කට ඉන්ධන පරිභෝජන පරීක්ෂාව සිදුකර නොතිබුණි. | සභාවේ වාහන 08 කට ඉන්ධන පරිභෝජන පරීක්ෂාව මෙම වර්ෂයේ සිදු කර ඇත. | අදාළ චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතු වේ. |

## 2 මූල්‍ය සමාලෝචනය

----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 99,749 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 42,925 ක් විය. මේ අනුව පසුගිය වර්ෂය සමග සැසඳීමේදී ප්‍රවර්තන වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.56,824කින් වර්ධනය වී තිබුණි.

### 2.2 ආදායම් පරිපාලනය

---------------------

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

-------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2019 | | | 2018 | | |
|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 690,000 | 59,900 | 120,200 | 950,000 | 70,550 | - |
| කුලී | 1,320,000 | 1,381,750 | - | 1,026,000 | 863,250 | 132,149 |
| බලපත්‍ර ගාස්තු | 305,000 | 457,898 | - | 117,500 | 189,299 | - |
| වෙනත් ආදායම් | 4,374,200 | 5,180,612 | 413,765 | 5,559,400 | 4,782,461 | 765,955 |
| | **6,689,200** | **7,080,160** | **533,965** | **7,652,900** | **5,905,560** | **898,104** |

#### 2.2.2 කුලී

----

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ හිඟ කඩ කුලී රු.28,000ක් අයකිරීම සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | හිඟ මුදල් අයකිරීමට කටයුතු කරමින් පවතී. | හිඟ කඩ කුලී නියමිත කාලය තුළ අයකිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු වේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ හිඟ බදු රු.92,200 ක් අයකිරීමට කටයුතු කර නොතිබුණි. | හිඟ බදු කුලී අයකිරීමට කටයුතු කරමින් පවතී. | හිඟ බදු කුලී නියමිත කාලය තුළ අයකිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු වේ. |

**2.2.3 අනෙකුත් ආදායම්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ අනෙකුත් හිඟ ආදායම් රු. 392,015 ක් අයකිරීම සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | රු. 392,015 ක් ගෙවන ලෙසට අදාල අයට උපදෙස් ලබාදී ඇත. | හිඟ මුදල් නියමිත කාලය තුළ අයකිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු වේ. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වගන්තියට අනුව, සභාව විසින් මහජන සෞඛ්‍ය උපයෝගී සේවා සහ පොදු මංමාවත් පිළිබඳව සියලු කරුණු පාලනය කිරීම් හා පරිපාලනය, සාමාන්‍යයෙන් ජනතාවගේ සුබවිහරණය, පහසුකම් සහ සුහසාධනය සහ ආරක්ෂා කිරීම සහ වැඩිදියුණු කිරීම පිළිබඳව හෙළිවූ කරණු පහත සඳහන් පරිදි විය.

**(අ) ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සභාව විසින් ක්‍රියාත්මක කළ යුතුව තිබූ ක්‍රියාකාරකම් 30 ක් සම්බන්ධයෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | සභාවේ අතුරු ව්‍යවස්ථා ප්‍රකාරව සුදුසු කටයුතු කළ යුතු වේ. |

**(ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (i) | ඝන අපද්‍රව්‍ය ජාතික ප්‍රතිපත්ති ප්‍රකාරව ඝන අපද්‍රව්‍ය වෙන් කිරීමකින් තොරව රැස් කරනු ලබන අතර කසළ බැහැර කරනු ලබන ස්ථානවල දෛනිකව රැස්කෙරෙන කසළ කැබැලි කර පස් දමා වසා නොතිබුණි. | ඝන අපද්‍රව්‍ය වෙන්කිරීමේ මධ්‍යස්ථානය මේ දක්වා සභාව විසින් ස්ථාපිත කර නොතිබුණි. | ඝන අපද්‍රව්‍ය කළමනාකරණයට අනුව ඵලදායි ක්‍රියාමාර්ග ගත යුතුවේ. |
| (ii) | විවෘත වාහනවලින් කසළ ප්‍රවාහනය කිරීම නිසා කසළ මාර්ගය පුරා වැටී තිබුණි. | අවම ප්‍රමාණයක කසළ පමණක් මාර්ගවල එකතු කරනු ලැබේ. | අපද්‍රව්‍ය රැස්කිරීමේදී පරිසරයට බලපෑම් සිදු නොවන පරිදි ආවරණය කළ වාහන භාවිතා කිරීමට කටයුතු කළ යුතු වේ. |

| | | |
|---|---|---|
| (iii) සන අපද්‍රව්‍ය කාර්යයන්වල යොදවනු ලබන සෞඛ්‍ය කම්කරුවන්ට වෛද්‍ය පරීක්ෂණයන් සභාව විසින් සිදුකර නොතිබුණි. | වෛද්‍ය පරීක්ෂණ සිදු කිරීමට නියමිතය. | නියමිත කාලයේ කම්කරුවන්ට වෛද්‍ය පරීක්ෂණයන් සිදු කිරීම තහවුරු කළ යුතු වේ. |

(ඇ) **පාරිසරික ගැටළු**

-----------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මැසි මදුරුවන් බෝවීම මර්ධනය සඳහා මැසි තෙල් ඉසීම සහ දුර්ගන්ධය වැලැක්වීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අදාළ ක්‍රියාමාර්ග ගනිමින් පවතී. | පරිසරය ආරක්ෂා කිරීමට උචිත ක්‍රියාමාර්ග ගත යුතුවේ. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

---------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සුසාන භූමි 06 කින් සභාව විසින් සුසාන භූමි බදු අයකිරීමට කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. | නියමිත කාලයේදි සුසාන භූමි බදු අයකිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පවතින දේපල සඳහා නැවත තක්සේරු කිරිම් සිදුකර වරිපනම් බදු අයකිරීමට කටයුතු කර නොතිබුණි. | වරිපනම් බදු අයකිරීමට කටයුතු කර නොතිබුණි. | නැවත තක්සේරු කළ දේපලවලින් වරිපනම් බදු අයකිරීමට සුදුසු ක්‍රියාමාර්ග යුතු වේ. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

---------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව විසින් නියමිත පරිදි මානව සම්පත් ලබාගෙන යොදවා නොතිබු බැවින්, එවැනි මානව සම්පත් 11 ක් විසින් ඉටු කළයුතු කාර්යයන් ප්‍රමාද වී තිබුණු බව විගණනයේදි නිරීක්ෂණය විය. | බඳවා ගැනීමට කටයුතු කරමින් පවති. | තනතුරු පුරප්පාඩු නියමිත කාලයේ පිරවීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු වේ. |

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ජලය බෙදාහැරීමේ අයිතමයන් කාර්යාල ගබඩාවෙහිත්, පරිශ්‍රයේත් පවති. මේ සඳහා සුදුසු ක්‍රියාමාර්ග කිසිවක් ගෙන නොතිබුණි. | 2019 වර්ෂයේ අවසන් තොග සමීක්ෂණයේදි වෙන්දේසියේ විකිණීම් සිදුවේ. | අයිතමයන් ඉවත් කිරීමට උචිත ක්‍රියාමාර්ග ගත යුතුවේ. |

**3.5 වත්කම් කළමනාකරණය**

**3.5.1 පවරා නොගත් වත්කම්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිරීක්ෂණය |
| --- | --- | --- |
| සභාවේ භාවිතයේ පවතින වාහන 12 ක අයිතිය මාරු කිරිමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | ක්‍රියාමාර්ග ගනිමින් පවති. | සභාවේ නමට අයිතිය මාරු කිරීමට කටයුතු කළ යුතු වේ. |

**4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය**

**4.1 අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සභාවේ අයවැය ඇස්තමේන්තුවේ වියදම් හා තථ්‍ය වියදම් අතර ප්‍රමාණාත්මක විචලනයක් නිරීක්ෂණය වීම නිසා මෙය ඵලදායී නොවූ අයවැයක් ලෙස දක්නට ලැබුණි. | 2019 වර්ෂයේ අයවැයෙහි වර්ගීකරණයේ වෙනස්කම් සිදුකර වියදම් සිදුකර තිබුණි. | අයවැය නිවැරදි ආකාරයෙන් සකස් කර සැලසුම් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වේ. |